## සන්නිවේදනය හා මධ්‍ය අධ්‍යයනය - 13 ශ්‍රේණිය

## 10 පාඩම - සන්නිවේදන ප්‍රතිපත්ති හා මාධ්‍ය නියාමනය

### I කොටස - සන්නිවේදන ප්‍රතිපත්ති

1. සන්නිවේදන ප්‍රතිපත්ති යනු මොනවාද? රටකට සන්නිවේදන ප්‍රතිපත්ති අවශ්‍ය වන්නේ ඇයි?
2. රටක මාධ්‍ය ප්‍රතිපත්තිය සකස් වන්නේ සන්නිවේදන ප්‍රතිපත්ති ඇසුරෙනි. මාධ්‍ය ප්‍රතිපත්තිවල අන්තර්ගත වන්නේ මොනවාද?
3. සන්නිවේදන ප්‍රතිපත්ති සැලසුම් කිරීම සඳහා පවත්වන ලද ප්‍රථම සම්මන්ත්‍රණය පවත්වා ඇත්තේ කුමන රටක කුමන වර්ෂයේදී ද?
3. යම්කිසි මාධ්‍ය ආයතනයක් විසින් තම ආයතනයට මාධ්‍ය ප්‍රතිපත්ති රාමුවක් සැකසීමේ දී අදාළ කරගත හැකි ලේඛන, අණ පනත් මොනවාද?
4. රටක මාධ්‍ය හෝ සන්නිවේදන ප්‍රතිපත්ති සකස් කිරීමේ දී **මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයට** හිමිවන්නේ වැදගත් ස්ථානයකි.
   i. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය එළි දක්වන ලද්දේ කවදාද?
   ii. විශ්ව මානව හිමිකම් දිනය යෙදී ඇත්තේ කවදාටද?
   iii. මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය එළිදැක්වීමට බල පෑ ප්‍රධාන හේතුව කුමක්ද?
   iv. එමගින් ප්‍රකාශ වන වැදගත්ම අදහස කුමක්ද?
   v. සන්නිවේදනය සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් අදාළ වන්නේ එහි කී වැනි වගන්තියද?
   vi. එම වගන්තියෙන් දැක්වෙන අදහස ලියා දක්වන්න.
5. මාධ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේ දී **ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්** සැලසී ඇති විධි විධාන පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.
6. සමාජයක **මාධ්‍ය නිදහස** ස්ථාපිත වන්නේ නම් එමගින් ග්‍රාහක දැනුම්වත් බව ප්‍රබලත්වයට පත්වීම වැළැක්විය නොහැකිය. මාධ්‍ය නිදහස සමාජයට වැදගත් වන්නේ ඇයි? කෙටියෙන් පැහැදිලි කරන්න.
7. ශ්‍රී ලංකාවේ බුද්ධිමය දේපල සඳහා ආරක්ෂාව සපයන්නේ **2003 අංක 36 දරණ බුද්ධිමය දේපල පනතයි.**
   i. බුද්ධිමය දේපල යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද?
   ii. ඊට අයත් ක්ෂේත්‍ර මොනවාද?
   iii. බුද්ධිමය දේපල පනතට අයත් ප්‍රකාශන හිමිකමේ ස්වරූප දෙක නම්කර ඒවා කෙටියෙන් විස්තර

කරන්න.

iv. බුද්ධිමය දේපල පනත යටතේ සාධාරණ භාවිතය යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

iv. භාවිතයට සාධාරණය ද යන්න නිර්ණය කිරීම සඳහා සලකා බැලිය යුතු කරුණු හතර නම් කරන්න.

## II කොටස - මාධ්‍ය නියාමනය

8. මාධ්‍ය නියාමනය ආරම්භ වන්නේ කුමන කරුණක් මුල් කරගනිමින් ද?

9. සමාජයකට මාධ්‍ය නියාමනය අවශ්‍ය වන්නේ ඇයි? කරුණු හතරක් සඳහන් කර ඉන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න.

10. ලෝකයේ මාධ්‍ය නියාමනය සඳහා භාවිත කරන මූලික ප්‍රවේශ හතර හඳුන්වා, එක් එක් ප්‍රවේශය සතු ලක්ෂණ තුන බැගින් ලියන්න.

11. ශ්‍රී ලංකාවේ මාධ්‍ය නියාමන ආයතන නම්කර ඒවායේ කාර්යය භාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

12. මාධ්‍ය ආචාර ධර්ම හඳුන්වා දීමේ මූලික අරමුණ කුමක්ද?

13. මාධ්‍ය ආචාර ධර්ම සංග්‍රහයක දක්නට ලැබෙන මූලික වගන්ති මොනවාද?

14. මාධ්‍ය මාර්ගෝපදේශ සංග්‍රහයක දැකිය හැකි කරුණු හතරක් සඳහන් කරන්න.

15. ශ්‍රී ලංකාවේ පුවත්පත් මාධ්‍ය ආචාර ධර්ම, ගුවන්විදුලි මාධ්‍ය ආචාර ධර්ම, රූපවාහිනී මාධ්‍ය ආචාර ධර්ම සහ නව මාධ්‍ය ආචාර ධර්ම පිළිබඳ කරුණු දෙක බැගින් සඳහන් කරන්න.

16. **කොවිඩ් 19** උවදුර හමුවේ සමස්ත ලෝකයම මුහුණ පා ඇති තත්ත්වය පිළිබඳව තොරතුරු වාර්තාකරණයේ දී කුමන මාධ්‍යයක වුවද (ජන මාධ්‍ය, නව මාධ්‍ය, සමාජ මාධ්‍ය) වෘත්තිකයන්, මාධ්‍යවේදීන්, නිර්මාණකරුවන් මාධ්‍ය ආචාර ධර්ම සහ මාධ්‍ය මාර්ගෝපදේශ පිළිපදිමින් වගකීමෙන් යුතුව තොරතුරු වාර්තාකරණයේ නියැලිය යුතුය. ඉහත අදහසට අනුව,

i. රජය මාධ්‍ය නියාමනය කළ යුත්තේ කුමන ආකාරයෙන් ද?

ii. වත්මන් මාධ්‍ය, මාධ්‍ය ආචාර ධර්ම සහ මර්ගෝපදේශවලට අනුකූලව යමින් තොරතුරු වාර්තාකරණයේ, නිර්මාණකරණයේ නියැලෙන්නේ ද? විමර්ශනය කරන්න.

***"උපතින් උරුම වන්නේ විපත පමණි.***

***ඒ අතරතුර සියල්ල අප විසින් මහන්සියෙන් උපයා ගත යුතුය."***

2020.03.31